**රත්නපුර ප්‍රාදේශීය සභාව - 2022**
**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

රත්නපුර ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට රත්නපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------- | ------------ |
| (අ) | මුද්දර ගාස්තු හා උසාවි දඩ ඌන බිල්කිරීම් රු.22,412,447ක් හා අධි බිල්කිරීම් රු.13,789,042ක් සඳහා ගැලපීම් කර නොතිබීමෙන් සමුච්චිත අරමුදල රු.8,623,405කින් අඩුවෙන් දැක්වුණි. | ඉදිරි වර්ෂයේ නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ උපචිත වියදම් රු.137,008ක් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී අපහරණය කළ ජංගම නොවන වත්කම්වල පිරිවැය එම වත්කම් ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. |
| (ඈ) | ගිණුම් විෂයයන් 06ක සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ සහ උපයෝගී ලේඛන අනුව ශේෂ අතර රු.5,542,498ක වෙනසක් විය. | දීර්ඝ කාලිනව පවතින මෙම නොසැසඳීම් හඳුනාගෙන නිවැරදි කරමින් යන බව. | වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කළ යුතු වේ. |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| -------- | ------------------------- | ------------ |
| එකතුව රු.94,071,961ක් වූ ගිණුම් විෂයයන් 12ක් වෙනුවෙන් විස්තරාත්මක උපලේඛන හා ශේෂ තහවුරුකිරීම් ඉදිරිපත් නොකෙරුණි. | වත්කම් තක්සේරු කර එම ගිණුම් යාවත්කාලින කිරිමට අදාළව උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු සිදු කරන බව. | විස්තරාත්මක උපලේඛන සකස් කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,425,476ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,402,031ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| ---------- | --------------- | ------ | ----------- | -------------- | --------------- | ------ | -------- | ----------- |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,539,784 | 1,279,385 | 1,274,251 | 66,110 | 2,054,234 | 2,761,069 | 2,754,211 | 62,532 |
| කුලී | 760,000 | 52,145 | 52,145 | - | 610,300 | 147,400 | 147,400 | - |
| බලපත්‍ර ගාස්තු | 1,672,200 | 1,112,750 | 1,112,750 | - | 1,713,950 | 939,325 | 939,325 | - |
| වෙනත් ආදායම් | 2,928,000 | 2,083,795 | 2,089,586 | - | 3,545,000 | 2,455,720 | 2,450,270 | 5,791 |
| | 7,899,984 | 4,528,075 | 4,528,732 | 66,110 | 7,923,484 | 6,303,514 | 6,291,206 | 68,323 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර 03කට වඩා පැරණි අක්කර බදු රු.28,374ක් හා වර්ෂ 04කට වඩා පැරණි ත්‍රී රෝද රථ ගාස්තු රු.258,000ක් අයකර නොතිබුණි. | අක්කර බදු හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව හා සක්‍රිය ත්‍රීරෝද රථ සාමාජිකයින් පමණක් සාමාජික ගාස්තු ගෙවා ඇති බව. | හිඟ ආදායම් රැස් කළයුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කට්ටිකර විකුණන ඉඩම්වල වටිනාකමින් සියයට 01ක බදු මුදලක් විකුණුම්කරුගෙන් සභාවට ලැබෙන පරිදි ගිවිසුම්ගත නොවී ඉඩම් වෙන්දේසි 03ක් සඳහා කට්ටි සැලසුම් අනුමත කර තිබුණි. එමෙන්ම, ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙන් ඉඩම් විකිණීමට අදාළ තොරතුරු ලබාගෙන අයවියයුතු ගාස්තු තීරණය කර නොතිබුණි. | ඉදිරියේදී ගිවිසුම්ගත වීමෙන් එම අඩුපාඩුව මගහරවා ගන්නා බවත් දැනට විකුණා ඇති ඉඩම් පිළිබඳ තොරතුරු ලබා ගෙන ගාස්තු අය කර ගැනීමට කටයුතු කරන බව. | සභාවට අයවිය යුතු ආදායම් රැස් කළ යුතු වේ. |
| (ආ) | සභා බල ප්‍රදේශය තුළ වාර්ෂිකව ඝන අපද්‍රව්‍ය ටොන් 09ක් පමණ බැහැර කරනු ලැබුව ද, සභාව සතුව විධිමත් කසළ කළමනාකරණ ක්‍රමවේදයක් නොතිබීම හේතුවෙන් දිරන කසළ එකතු කර රත්නපුර මහා නගර සභාවේ කසළ අංගනයට භාර දී තිබුණි. | එකතු කරන දිරන කසළ දැමීම සඳහා ඉඩමක් හඳුනාගෙන ඉදිරියේදී මෙම ගැටළුව විසඳීමට පියවර ගන්නා බව. | ඝන අපද්‍රව්‍ය කළමණාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු වේ. |

## 3.2 ආර්ථික නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| භාණ්ඩාගාර චක්‍රලේඛ මගින් රාජ්‍ය වියදම් දැඩි ලෙස සීමා කර තිබුණ ද, කොග්ගල නිවාඩු නිකේතනයක නේවාසික පුහුණු වැඩසටහනක් පැවැත්වීමට රු.350,000ක් වැයකර තිබුණි. එම ගෙවීම තුළ 19 දෙනෙකුගේ ආහාර හා නවාතැන් වෙනුවෙන් සාවද්‍ය ලෙස රු.142,500ක් ගෙවා තිබුණි. | අදාල ගෙවීම් සම්බන්ධයෙන් පරීක්ෂා කර සාවද්‍ය ගෙවීම්, වගකිව යුතු පුද්ගලයින්ගෙන් අය කර ගැනීම සඳහා ඉදිරි කටයුතු සිදු කිරීමට පළාත් පාලන කොමසාරිස් වෙතින් උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3.3 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2006 වර්ෂයේදී සභාව විසින් අයුතු ලෙස පෞද්ගලික ඉඩමක් හරහා මාර්ගයක් ඉදිකිරීමට එරෙහිව පවරන ලද නඩුවල තීන්දු ලෙස, පැමිණිලිකාරියට එම ඉඩමේ නිරවුල් භුක්තිය නැවත ලබා දී තිබුණු අතර වන්දි මුදල්, නඩු ගාස්තු හා නීතිඥ ගාස්තු ලෙස රු.479,505ක් 2022 වර්ෂයේ දී ගෙවීමට සභාවට සිදු වී තිබුණි. | නඩු තීන්දුව අනුව ගෙවීමට සිදු වූ මුදල වගකිව යුතු පුද්ගලයින්ගෙන් අය කර ගැනිම සඳහා අවසන් නිවේදන යවා ඇති බවත් ලබා දී ඇති කාල සීමාව තුළ අදාළ මුදල් නොගෙවන්නේ නම් නිතිමය කටයුතු සිදු කිරීමටත් බලාපොරොත්තු වන බව. | වගකිව යුතු පාර්ශව නිශ්චය කර අදාළ මුදල අයකර ගත යුතු වේ. |

## 3.4 වාහන පාලනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ධාවනය කළ නොහැකි තත්ත්වයේ පැවති වාහන 08ක හා ට්‍රැක්ටර් ටේලර් 04ක අපහරණ කටයුතු, 2022 දෙසැම්බර් මාසය දක්වාම නිමකර නොතිබුණි. | අපහරණය කළ හැකි බවට හඳුනාගත් වාහන ටෙන්ඩර් කළ ද ඉල්ලීම් ඉදිරිපත් වී නොමැති බැවින් නැවත ටෙන්ඩර් කිරිමට යෝජිත බව. | අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | රු.972,700ක වාහන අලුත්වැඩියා වියදමක් සඳහා සුදුසුකම්ලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ වාර්තාවක් ලබාගෙන නොතිබුණි. | අලුත්වැඩියාව අදාළ නියෝජිත ආයතනයෙන්ම සිදු කර ඇති බැවින් නැවත යාන්ත්‍රික ඉංජිනේරු වෙත යොමු නොකළ බව. | අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | ඉන්ධන ඇණවුම් අනුව, අවස්ථා 03කදී වාහනයකට යෙදූ ඉන්ධන ලීටර් 120ක් එහි ටැංකි ධාරිතාව ඉක්මවා තිබුණු බැවින් ඒ සඳහා වැයකළ රු.35,053 ක් සහ ඩීසල් කැබ් රථයක් වෙනුවෙන් රු.12,600ක පෙට්‍රල් ලීටර් 30ක් නිකුත් කර තිබීම සාවද්‍ය ගෙවීම් විය. | සභාපතිගේ නිළ රථය සඳහා සභාපතිවරයා විසින් තෙල් සංචිතයක් පවත්වාගෙන යාමට කටයුතු කර ඇති බව හා පෙට්‍රල් ලීටර 30 සඳහා වැය වූ මුදල අයකර ගැනීමට කටයුතු කරන බව. | සාවද්‍ය ගෙවීම් වලක්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සභාපතිවරයා විසින් 2021 සහ 2022 වර්ෂවල දී ප්‍රසම්පාදන ක්‍රමවේදයෙන් බැහැරව කුලී පදනම මත ලබාගත් කැබ් රථයක් සඳහා රු. 87,545 ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් අයකර ගැනිමට කටයුතු කරන බව. | සාවද්‍ය ගෙවීම් වලක්වා ගැනීමට කටයුතු කළ යුතුවේ. |